# 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය

## 23 පාඩම


සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 23 පාඩම

# ශ්‍රද්ධාව නිවන් මගෙහි පිවිසුමයි

# ශ්‍රද්ධාව නිවන් මගෙහි පිවිසුමයි

- ශ්‍රද්ධාව  වැපිරිය යුතු බීජයක් ලෙස සැලකීමට හේතුව

ශ්‍රද්ධාව මුල් කරගෙන නිවන් මගට පිවිස එහි ගමන් කරන ශ්‍රාවකයා සීලයෙන් සමාධියට ද, සීලයෙන් හා සමාධියෙන් ප්‍රඥාවට ද ළඟා වී රාග, ද්වේශ, මෝහ ආදී කෙලෙස් ගිනි නිවා සියලු දුක් නිම කිරීම යි

# ශ්‍රද්ධාව යනු...

- ශ්‍රද්ධාව නම් අප සිතෙහි තෙරුවන් පිළිබඳ ව ඇති වන විශ්වාසය යි

- නුවණින් විමසා කරුණු තේරුම් ගෙන ත්‍රිවිධ රත්නයෙහි ගුණ මහිමය පිළිබඳ ව සිත් සතන් තුළ ඇති කර ගන්නා පැහැදීම යි

- බුදුරදුන්ගේ බුද්ධත්වය පිළිබඳවත්, ධර්මයෙහි ගුණ මහිමයත්, සංඝයාගේ  සුපටිපන්නතාව පිළිබඳවත් ඇති වන විශ්වාසය මෙයින් අදහස් කෙරේ

- මෙම ශ්‍රද්ධාව යනු අවබෝධයෙන් තොර පැහැදීම හෝ අන්ධ භක්තිය හෝ නොවේ. පදනමක් නැති ඇදහීම හෝ අවිචාරවත් විශ්වාසය හෝ නොවේ

# අවෙච්චප්පසාදය යනු...

- ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම යි

# ශ්‍රද්ධාවේ ආකාර දෙකකි

1. අමූලිකා ශ්‍රද්ධා

2. අකාරවතී ශ්‍රද්ධා

# ශ්‍රද්ධාවේ ආකාර දෙකකි

## 1. අමූලිකා ශ්‍රද්ධා

- කරුණු නොදැන පදනමකින් තොරව ඇති වන ශ්‍රද්ධාව අමූලිකා ශ්‍රද්ධා හෙවත් මුල්නැති ශ්‍රද්ධා ලෙස හැඳින්වේ

# ශ්‍රද්ධාවේ ආකාර දෙකකි

## 2. අකාරවතී ශ්‍රද්ධා

- කරුණු දැනීමෙන් ඇතිවන ශ්‍රද්ධාව අකාරවතී ශ්‍රද්ධා (බුද්ධිමය ශ්‍රද්ධාව) ලෙස හැඳින්වේ
- අවෙච්චප්පසාදය ඇති වනුයේ අකාරවතී ශ්‍රද්ධාන තුළිනි
- අකාරවතී ශ්‍රද්ධාව ඇති වනුයේ කරුණු විමසීමෙන් බැවින් තෙරුවන පිළිබඳ ව කරුණු විමසීමට, පරීක්ෂා කිරීමට, ප්‍රශ්න කිරීමට බුදුන් වහන්සේ අනුබල දී ඇත

# නිවන යනු...

- නිවන යනු නිවීමයි
- රාග, ද්වේස, මෝහ යන කෙලෙස් ගිනි නිවා ගැනීම යි
- රාගය නම් අරමුණුවල ඇලෙන ගතිය යි
- ද්වේසය නම් අරමුණුවල ගැටෙන ගතිය යි
- මෝහය නම් මුළා වන ගතිය යි
- මේවා පාලනය කර ගැනීමට ශ්‍රද්ධාව බෙහෙවින් ම උපකාරී වේ

# තෙරුවන් සරණයි..!